# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2460/09 – 2025 ඔක්තෝබර් මස 28 වැනි අඟහරුවාදා - 2025.10.28**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2020/271(2).

**කාර්මික ආරාවුල් පනත – 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.11.23 දිනැති හා අංක 2359/34 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.11.15 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් පන්නිපිටිය, ඇරැව්වල, අංක 364/14 ලිපිනයෙහි පදිංචි ඒ.ආර්. කරුණාසේන මහතා සහ කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, අංක 34 ලිපිනයෙහි පිහිටි ජාතික නිවාස සංවර්ධන අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A /72/2023 හා 2025.09.04 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ඔක්තෝබර් මස 14 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A – G 045663 – 24 (2025/10)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කොළඹ බේරුම්කරණ සහ කාර්මික අධිකරණ ශාඛාව.**

නඩු අංකය - A/72/2023
යොමු අංකය - IR/COM/03/2020/271(2)

ඒ. ආර්. කරුණාසේන මයා,
නො. 364/14,
ඇරැව්වල,
පන්නිපිටිය.

සහ

*පළමු පාර්ශ්වය*

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය,
නො. 34,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 02.

*දෙවන පාර්ශ්වය*

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර අමාත්‍යවරයා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 04 සහ 1968 අංක 39(1967 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය ) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, මෙම ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා 2023.10.18 දින දරන බේරුම්කරු වශයෙන් එම්.එම්. අයි. ආර්. ඒ. ජයතිලක වන මා පත් කර ඇත.

මෙම කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් පහත සඳහන් පරිදි ප්‍රකාශයට පත් කර ඇත.

"ඒ ආර්.කරුණාසේන මහතාට 2004 වර්ෂයේ සිට බලපැවැත්වෙන පරිදි MM1-1 (ii) ශ්‍රේණියේ ගණකාධිකාරි තනතුර ලබාදීම සුදුසු ද නැත්ද? යන්නත් ලබාදීම සුදුසු නම් ඔහුට හිමි විය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ.''

1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ 39 වන වගන්තියට අනුව අමාත්‍යවරයාට පැවරී ඇති බලතල ප්‍රකාරව ඔහු විසින් පනවන ලද නියෝග අංක 21 (1) හා 21 (2) මඟින් දක්වා ඇති පරිදි ආරාවුලට විෂය වී ඇති සම්පූර්ණ කරුණු සම්බන්ධයෙන් වූ විස්තර ප්‍රකාශයක් දෙපාර්ශ්වයෙන්ම ලබා ගතිමි. අනතුරුව ප්‍රතිවිරුද්ධ පාර්ශ්වය වෙතින් ලද විස්තර ප්‍රකාශයට පිළිතුරු ලෙස වූ ප්‍රතිඋත්තර ප්‍රකාශයක් දෙපාර්ශ්වය වෙතින් වෙන වෙනම ලබා ගතිමි. 2023.12.15 වන දින දෙපාර්ශ්වය කැඳවා ආරාවුල නිරවුල් කර ගැනීම සම්බන්ධයෙන් යම් එකඟතාවයක් ඇති කර ගෙන ආරාවුල සමථයකට පත් කර ගැනීම කෙරෙහි දෙපාර්ශ්වයේ එකඟත්වයක් ඇත්දැයි පරීක්ෂා කර බැලුවෙමි. එවැනි එකඟතාවයක් පෙන්නුම් නොකරන ලද අතර බේරුම්කරණය සඳහා වූ සාක්ෂි විභාගය සඳහා ඉදිරි පියවර ගැනීමට තීරණය කළෙමි. ඒ අනුව මීළඟ සාක්ෂි විභාගය 2024.01.10 දින පෙ.ව.10.00ට පැවැත්වීමට දින නියම කළෙමි.

සාක්ෂි විභාගය 2023.12.15 දින සිට 2024.08.30 දින දක්වා පවත්වන ලද අතර 2024.10.09 වන දිනට දෙපාර්ශ්වයේ අවසන් ලිඛිත දේශන ලබා දෙන ලෙස නියම කර 2025.09.04 දිනැති ප්‍රදානය ලබාදීමට පහත සඳහන් පියවර ගතිමි.

කාර්මික ආරාවුල් පනතේ අමාත්‍යවරයා විසින් පනවන ලද නියෝග අංක 21 (1) හා 21(2) අනුව කාර්මික ආරාවුල ඇතිවීමට හේතු වූ කාරණා පිළිබඳව දෙපාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද ප්‍රකාශ හා ප්‍රතිඋත්තර ප්‍රකාශයන්ද ඉදිරිපත් වූ වාචික හා ලිඛිත සාක්ෂි ද විශ්ලේෂනය කර සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් ලබාදීමට පහත සඳහන් පරිදි සාක්ෂි විශ්ලේෂනය කළෙමි.

**සාක්ෂි විශ්ලේශනය**

ඒ.ආර්. කරුණාසේන මහතාට 1986.08.27 දින සිට ක්‍රියාත්මක වන පරිදි පොත් තැබීමේ ලිපිකරුවෙකු ලෙස පරිවාස කාලයකට යටත්ව ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ පත්වීමක් ලබා දී ඇත. (අංක 3/2/3/5/10/11 හා 1988 ජනවාරි 29 දිනැති පත්වීම් ලිපිය) පරිවාස කාලය අවසන් කිරීමෙන් පසුව අංක : 3/2/3/5/8/99 හා 1990.12.13 දිනැති ලිපිය මඟින් පරිවාස කාලය අවසන් කර 1986.08.27 දින සිට ix වන ශ්‍රේණියේ පොත් තැබීමේ ලිපිකරුවෙකු වශයෙන් ස්ථිර කර ඇත. අංක:3/2/2/8/101 හා 2000.11.07 දිනැති නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පාලන) ගේ ලිපිය මඟින් vii වන ශ්‍රේණියේ ii පන්තියේ "අ" ශ්‍රේණියේ ගිණුම් සහකාර තනතුරට උසස් කර ඇත.

ඉහත පත්වීම් සහ ස්ථිර කිරීමත් උසස් කිරීමත් දෙපාර්ශ්වය විසින්ම පිළිගෙන ඇත.

පළමු පාර්ශ්වයේ මූලික සාක්ෂි ලබා දෙමින් කියා සිටින්නේ නිවාස සංවර්ධන අධිකාරියේ අවුරුදු 4කට වරක් සේවක උසස්වීමක් ලබා දෙන අතර එම ආයතනය විසින් පවත්වා ගෙන යනු ලබන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියේ ද ඒ බව සඳහන් කර තිබෙන බවකි. නමුත් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියේ එවැන්නක් සඳහන්ව ඇති බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කිරීමට පළමු පාර්ශ්වය අසමත් විය.

දෙවන පාර්ශ්වය විසින් එවැනි අවුරුදු 4 කට වරක් උසස් කිරීමේ පටිපාටියක් තිබූ බව සාක්ෂි විභාගයේදී ප්‍රතික්ෂේප කර සිටී. ඒ අනුව පළමු පාර්ශ්වයේ එම ප්‍රකාශය බැහැර කිරීමට තීරණය කරමි.

දෙවන පාර්ශ්වය අවධාරණය කරමින් කියා සිටින්නේ ආයතනයේ යම් පුරප්පාඩුවක් ඇති වූ විට එම තනතුර සඳහා සුදුසුකම් ලත් බාහිර සහ අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර එම පුරප්පාඩු පුරවන බවකි. පුරප්පාඩු ඇති වන අවස්ථාවේදී ක්‍රියාත්මකව පවතින බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය අනුව මෙම පුරප්පාඩු පිරවීමට කටයුතු කරන බවද දෙවන පාර්ශ්වය විසින් පෙන්වා දෙන ලදී. ඒ බව තහවුරු කිරීමට 1999, ,2005, 2010 වර්ෂවල අනුමත කර ගන්නා ලද බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටි වල සහතික කරන ලද පිටපත් සාක්ෂි විභාගයේ දී ලකුණු කරන ලද ලේඛන ලෙස ඉදිරිපත් කර ඇත. පළමු පාර්ශ්වය එම ලේඛන පිළිබඳව විරෝධතාවයක් නොදක්වන නමුත් අධ්‍යක්ෂක මණ්ඩලයේ යෝජනා සම්මතයන්ට යටත්ව සමහර පුරප්පාඩු පිරවීමට අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ක්‍රියා කරන ලද බවට පළමු පාර්ශ්වය විසින් නඟන ලද චෝදනා ප්‍රතික්ෂේප කිරීමට දෙවන පාර්ශ්වය විසින් සාක්ෂි විභාගයේදී පියවර ගෙන නැති නමුත් බඳවා ගැනීම් හා උසස් කිරීම් කරනු ලබන විධිමත් ක්‍රමය වනුයේ එම අවස්ථාවේ ක්‍රියාත්මක බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියට අනුව කටයුතු කිරීම බව අවධාරණය කර සිටී

පළමු පාර්ශ්වයේ පැමිණිලිකරුගෙන් හරස් ප්‍රශ්න ඇසීමේදී බේරුම්කරු විසින් කරන ලද ප්‍රශ්න කිරීම්වලට පහත සඳහන් පිළිතුරු ලබා දී ඇත.

ප්‍ර: ඔබ හිතන විදිහට ඔබව මේ ඔබේ ඉල්ලීම ඉටු නොකර ඔබට ලැබිය යුතු උසස්වීම ලබා නොදී අනෙක් අයට ඒ වෙනුවට උසස්වීම් හෝ වෙනත් වරප්‍රසාද ලබාදීමට හේතුව කුමක්ද ඔබ හිතන විදිහට?

පි: සමහර විට ස්වාමිනි නිවාස සංවර්ධන අධිකාරියේ විවිධ ක්‍රම මඟින් උසස්වීම් ලබා දෙනවා.

ප්‍ර: විවිධ ක්‍රම පැහැදිලි කරන්න?

පි: සංවත්සර උත්සව තියලා. ඊට පස්සේ දේශපාලන පලිගැනීම් තියෙනවා, ඊට පස්සේ සුවිශේෂී පුද්ගලයින් කියලා, මේ ආකාරයට විවිධක්‍රම වලට උසස්වීම් ලබා දෙනවා.

ප්‍ර: ඒවා බඳවා ගැනීම් හා උසස් කිරීමේ පරිපාටියේ සඳහන් වෙනවාද?

පි: සඳහන් වෙන්නේ නැහැ ස්වාමිනි. ඉතින් මේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ සිසිර කුමාර මහත්මයාට MM 1-2 තනතුර ලබා දීලා තිබුනා. එයා මටත් වැඩිය ගොඩක් ජුනියර් කෙනෙක් අවු:2ක් වගේ වැඩ බැලීමේ රාජකාරි කටයුතු කළේ. එයාට ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී තනතුර ලබා දුන්නා: (2023.12.15 සාක්ෂි සටහන් පිටු අංක 18)

කෙසේ නමුත් 2004 වර්ෂයේ ගිණුම්අංශයේ පුරප්පාඩු පිරවීමට අයදුම්පත් කැඳවා තිබූ නමුත් පළමු පාර්ශ්වය ඊට අයදුම්කර නැති අතර එසේ අයදුම් පත්‍රයක් ඉදිරිපත් නොකළේ තමන්ට ඉල්ලා ඇති සුදුසුකම් නොමැති නිසා බව සාක්ෂි විභාගයේදී පැමිණිලිකරු වන ඒ.ආර්.කරුණාසේන මහතා පිළිගනී.

6/2006 රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛය හා කළමනාකරණ සේවා චක්‍ර ලේඛ 30 අනුව ලබා දී ඇති උපදෙස් හේතුවෙන් නව බඳවා ගැනීම් හා උසස්වීම් ප්‍රමාද කිරීමට සිදුව තිබූ බව දෙවන පාර්ශ්වය ප්‍රකාශ කර සිටී.

කළමනාකරණ සේවා චක්‍ර ලේඛ 30හි 5 වන ඡේදය අනුව උසස් කිරීම සඳහා පැවති උසස් කිරීම් හා බඳවා ගැනීමේ පටිපාටියට අනුව කටයුතු කිරීම නතර කර තම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියක් පිළියෙළ කර අනුමත කරවා ගත යුතුව තිබුනි. ඒ අනුව 2006 සිට උසස් කිරීම් ප්‍රමාද වූ බව දෙවන පාර්ශ්වය කියා සිටී.

කෙසේ හෝ 2008/2009 වර්ෂයේ පුරප්පාඩු පිරවීම සඳහා බාහිර සහ අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් අයදුම් පත්‍ර කැඳවා ඇත. ඒ.ආර්. කරුණාසේන මහතාද vi වන ශ්‍රේණියේ ගණකාධිකාරී තනතුර සඳහා අයදුම් කර ඇත. නමුත් ඔහු අපේක්ෂා කරන ලද තනතුර සඳහා උසස්වීම් නොලැබී ඇති බැවින් ඒ සඳහා අභියාචනයක් ඉදිරිපත් කර ඇත. එම අභියාචනයේ ප්‍රතිඵලයක් ලෙස ඔහු 2011.01.05 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි vi වන ශ්‍රේණියේ සහකාර ගණකාධිකාරී තනතුරට උසස් කර ඇත.

සහකාර සාමාන්‍යාධිකාරිවරිය මූලික සාක්ෂි ලබාදීමේදී බේරුම්කරණයෙන් ප්‍රශ්න කර සිටී.

ප්‍ර: ඉල්ලුම්පත් කැඳ වූ අවස්ථාවේ මෙතුමා අයදුම්පත් ඉදිරිපත් කළාද?

පි: vi ශ්‍රේණියේ ගණකාධිකාරී තනතුර ඉල්ලා තියෙනවා. 2008/2009 අයදුම්පත්‍ර කැඳවීම් අනුව තනතුරු ලබා දීලා තියෙන්නේ 2011.01.05 දින.

වැඩිදුරටත් සාක්ෂිකාරිය මෙසේ කියා සිටී

2008/2009 අදාළව 2009.12.08 දින අභ්‍යන්තර උසස්වීම් සඳහා කැඳවීම් කිරීම අනුව කරුණාසේන මහතා vi ශ්‍රේණියේ සහකාර ගණකාධිකාරී තනතුරට අයදුම් කලද ඔහුට එම තනතුර නොලැබුන බැවින් ඒ සම්බන්ධව ඉදිරිපත් කල අභියාචනයෙන් සහ පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයට අනුව 2011.01.05 දිනැතිව සහකාර ගණකාධිකාරී තනතුර කරුණාසේන මහතාට ලැබුණු බවයි. (2024.05.20 සාක්ෂි සටහන් පිටු අංක 11)

2011.01.05 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඒ. ආර්. කරුණාසේන මහතා සහකාර ගණකාධිකාරී තනතුර දක්වා උසස් කර ඇති බව දෙපාර්ශ්වය ම පිළිගනී.

2006.01.01 දින සිට ක්‍රියාත්මක විය යුතු 2006.09.22 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍ර ලේඛය අනුව තනතුරු නාම ප්‍රතිව්‍යුහගත කර සංශෝධිත වැටුප් තලවල පිහිටුවන ලෙස උපදෙස් දී ඇත. තනතුරු නාම ප්‍රතිව්‍යුහගත කිරීමේදී පහත සඳහන් පරිදි එම ප්‍රතිව්‍යුහගත කිරීම සිදු කර ඇත.

| ***කලින් පැවති*** | | ***ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු*** | |
|---|---|---|---|
| **තනතුරු නාමය** | **ශ්‍රේණිය** | **තනතුරු නාම** | **වැටුප් පරිමාණය** |
| ගණකාධිකාරී | v ශ්‍රේණිය | ගිණුම් නිලධාරී | JM1-1 |
| සහකාර ගණකාධිකාරී | vi ශ්‍රේණිය | ගිණුම් නිලධාරී | MA 5-2 |
| ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී | iv ශ්‍රේණිය | ගණකාධිකාරී | MM 1-1(ii) |
| ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී | iii ශ්‍රේණිය | ගණකාධිකාරී | MM 1-1(i) |

ඉහත කළමනාකාරණ සේවා චක්‍ර ලේඛ අංක 30 අනුව ශ්‍රේණි ක්‍රමය වෙනුවට වැටුප් පරිමාණය අනුව වැටුප් තලවල පිහිටුවා ඇත.

පැමිණිල්ලෙන් හරස් ප්‍රශ්න සහකාර සාමාන්‍යාධිකාරිවරියගේ මූලික සාක්ෂි ලබාදීමේදී බේරුම්කරණයෙන් ප්‍රශ්න කරයි.

ප්‍ර: ගිණුම් නිලධාරී කියන තනතුර සහකාර ගණකාධිකාරී තනතුරට වඩා පහළද?

පි: සහකාර ගණකාධිකාරී තනතුරට වඩා ඉහළ තනතුර JM 1-1 (ii) ගිණුම් නිලධාරී,

ප්‍ර: ගිණුම් නිලධාරී කියන තනතුර?

පි: ඉහළ තනතුරක් සහකාර ගණකාධිකාරී කියන තනතුරක් ඉහළ තනතුරක්,

(2023.04.25 සාක්ෂි සටහන් 5 වන පිටුව)

| *කළමනාකරණ මට්ටම* | *කලින් පැවති ශ්‍රේණි ක්‍රමය අනුව* | *තනතුරු නාම ප්‍රතිව්‍යුහගත කිරීමෙන්පසු* |
|---|---|---|
| ඉහළ කළමනාකරණ මට්ටම | i<br>ii (i)<br>ii (ii)<br>iii | HM 2-3<br>HM 1-3<br>HM 1-1 |
| මධ්‍යම කළමනාකරණ මට්ටම | iv<br>v | MM 1-1 1<br>MM 1-3<br>MM 1 - 1 (ii) |
| කනිෂ්ඨ කළමනාකරණ මට්ටම | vi<br>vii | JM 1-1 (i)<br>JM 1-1 (ii) |
| අධීක්ෂණ මට්ටම | vii (A) | MA 5-2 (i)<br>MA 5-2 (ii)<br>MA 1-2 iii, ii, i<br>MA 2-2 iii, ii, i |

ඒ අනුව ඒ.ආර්. කරුණාසේන මහතාට 2011.01.05 දින සිට කලින් පැවති ශ්‍රේණි ක්‍රමය අනුව කනිෂ්ඨ කළමනාකරණ මට්ටමට අදාළ vi ශ්‍රේණියේ සහකාර ගණකාධිකාරිවරයෙකු ලෙස උසස්වීමක් ලැබී ඇත. මෙහිදී ආයතනය තුල ක්‍රියාත්මක වූ කලින් පැවති ශ්‍රේණි ක්‍රමය අනුව ඒ.ආර්. කරුණාසේන මහතා vii ශ්‍රේණියේ (අධීක්ෂණ මට්ටම) සිට කනිෂ්ඨ කළමනාකරණ මට්ටම වූ vi ශ්‍රේණියේ සහකාර ගණකාධිකාරි තනතුරට පත්ව ඇත.

නමුත් වගුවේ 3 වන තීරුවේ තනතුරු ප්‍රතිව්‍යුහගත කිරීම අනුව ඔහුට ලබා දී ඇත්තේ කළමනාකරණ මට්ටමක් නොවන අධීක්ෂණ මට්ටමක ඇති MA 5-2 වැටුප් පරිමාණයකි. මෙම තනතුරු නාම ප්‍රතිව්‍යුහගත කිරීම හේතුවෙන් ඒ.ආර්. කරුණාසේන මහතා කනිෂ්ඨ කළමනාකරණ මට්ටමේ සිටි අධීක්ෂණ මට්ටම දක්වා පහළට වැටී ඇත.

මෙම විෂමතාවය ඉවත් කිරීම සඳහා අංක 12/8364/2016 දරනඅධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාව මගින් vi ශ්‍රේණියේ ගණකාධිකාරි ධූරයට හිමි වැටුප් පරිමාණය MA 5-2 වැටුප් පරිමාණයේ සිට JM 1-1 (ii) වැටුප් පරිමාණය ලෙස සාමාන්‍යාධිකාරිගේ අංක 3/2/1/1/254 හා 2017.01.01 දිනැති ලිපිය මගින් 2012.03.19 දින සිට ක්‍රියාත්මක වන පරිදි වෙනස් කර ඇත. JM 1-1 (ii) වැටුප් පරිමාණය කනිෂ්ඨ කළමනාකරණ මට්ටමට අදාළ වැටුප් පරිමාණයකි.

නමුත් 2010 බඳවාගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය අනුව JM 1-1 (ii) වැටුප් පරිමාණයේ ගිණුම් නිලධාරි තනතුරට අනුරූප vi ශ්‍රේණියේ සහකාර ගණකාධිකාරි තනතුරේ සිට JM 1-1 (i) වැටුප් පරිමාණයේ ගිණුම් නිලධාරි තනතුරට අනුරූප v වන ශ්‍රේණියේ ගණකාධිකාරි තනතුරට උසස්වීම සඳහා vi ශ්‍රේණියට අනුරූප JM 1-1 (ii) වැටුප් පරිමාණයේ ගිණුම් නිලධාරි තනතුරේ අවුරුදු 5ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර, පුරප්පාඩු පවතින පරිදි අයදුම්පත් කැඳවන විට අයදුම් කළ යුතුව ඇත.

එසේ නමුත් 2017.01.01 දිනැති සාමාන්‍යාධිකාරිගේ අංක : 3/2/1/1/254 දරන JM 1-1 (ii) වැටුප් පරිමාණය ලබාදීමේ ලිපියේ සඳහන් 2017.01.01 දිනයෙන් පසු අයදුම්පත් කැඳවීමක් සිදු ව නැති බැවින් ඒ.ආර්. කරුණාසේන මහතා විශ්‍රාම ගිය දිනය වූ 2018.06.04 දින දක්වා JM 1-1 පරිමාණයට අනුරූප v ශ්‍රේණියේ ගණකාධිකාරි තනතුරකට අයදුම් කිරීමට ඔහුට නොහැකි වී ඇත.

ඒ අනුව ඔහු v ශ්‍රේණියට අනුරූප M 1-1 (1) වැටුප් පරිමාණයේ ගිණුම් නිලධාරි තනතුරට පැමිණීමට නොහැකි වී ඇත. කෙසේ නමුත් v ශ්‍රේණියට අනුරූප JM 1- 1 (i) වැටුප් පරිමාණයේ ගිණුම් නිලධාරි සිට iv ශ්‍රේණියට අනුරූප MM 1- 1 (ii) වැටුප් පරිමාණයට අදාළ ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරි තනතුරට උසස්වීමට නම් නව බඳවා ගැනීමේ හා උසස්වීමේ පටිපාටියට අනුව පහත සඳහන් අධ්‍යාපන හා පළපුරුද්ද පිළිබඳ පහත සඳහන් සුදුසුකම් ඔහුට තිබී නැත. නමුත් ඔහු vi ශ්‍රේණියේ සිට iv ශ්‍රේණියට අයදුම්පත්‍රයක්වත් ඉදිරිපත් කර නැත.

සහකාර සාමාන්‍යාධිකාරියගෙන් බේරුම්කරු ප්‍රශ්න කරයි.

ප්‍ර: ඉල්ලුම්කරුගේ පුද්ගලික ලිපි ගොනුව පරික්ෂා කරලා කියන්න. 2014 වර්ෂයේ අයදුම්පත්‍ර යොමු කරලා තියෙනවාද?

පි: පුද්ගලික ලිපිගොනුව අනුව අයදුම්පතක් ඉදිරිපත් කර ඇති බව සනාථ වෙනවා. සහකාර ගණකාධිකාරි vi වන ශ්‍රේණියට 2008 ඉදිරිපත් කරලා තියෙනවා, iv වන ශ්‍රේණියේ ගණකාධිකාරි තනතුරට අයදුම්පතක් ඉදිරිපත් කළ බව නිරීක්ෂණය වන්නේ නැත.

(2024.04.03 සාක්ෂි සටහන්වල 5 වන පිටුව)

2010 බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියට අනුව iv ශ්‍රේණියට අවශ්‍ය සුදුසුකම් (අභ්‍යන්තර අයදුම්කරුවන්)

අදාළ තනතුරට පැවරෙන විෂයය ක්ෂේත්‍රයට අදාළ කනිෂ්ඨ කළමනාකරණ (JMI-1) සේවා ගනයේ වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

නමුත් ඒ.ආර්. කරුණාසේන මහතා අ.පො.ස (උ.පෙළ) විෂයන් දෙකකින් පමණක් සමත් වී ඇති අයෙකි. ඒ අනුව 2018.06.04 දින ඔහු විශ්‍රාම නොගියද MM 1-1 (ii) වැටුප් පරිමාණයට අදාළ ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරි තනතුරට සුදුසුකම් නොලබයි.

තවද පළමු පාර්ශ්වය විසින් සාක්ෂි විභාගයේදී පෙන්වා දී ඇත්තේ 2021 ජනවාරි 11 දිනැති අංක: 10161 දරන අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති බවත් එම අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවේ මූලික අරමුණ වනුයේ කළමනාකරණ සේවා චක්‍ර ලේඛ අංක 30 අනුව සේවක වැටුප් සැකසීමේදී අසාධාරණයට ලක් වූ සියළුම සේවකයින්ට සාධාරණයක් ඉටු කිරීම සහ සේවකයින් 11 දෙනෙකුට අදාළව ඔවුන්ට පෞද්ගලික වන ලෙස සිදු වී ඇතැයි කියන අසාධාරණයක් ඉවත් කිරීම වේ.

ඉහත සේවකයින්ට සිදු වී ඇති අසාධාරණයන් හඳුනා ගෙන ඇත්තේ 2021.01.04, 2020.12.24, 2020.11.16, 2020.11.11, 2020.07.07 දිනයන්හි පවත්වන ලද සේවක අභියාචනා කමිටු රැස්වීම් වලදී වන අතර එම අභියාචනා කමිටු මගින් සේවකයින්ට සිදු ව ඇති අසාධාරණයන් ඉවත් කිරීමට ඉදිරිපත් කරන ලද නිර්දේශයන් ඇතුළත් කැබිනට් අංක: 10161 ලෙස සම්මත කර ගෙන ඇත.

පළමු පාර්ශ්වය එම අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව සාක්ෂි විභාගයේදී ලකුණු කරන ලද ලේඛනයක් ලෙස ඉදිරිපත් කරමින් එම ලේඛනයේ අංක 2 දරන නිර්දේශය අනුව ඒ.ආර්. කරුණාසේන මහතාට 2012.03.19 දින සිට ඔහු ලබමින් සිටි JM 1-1 (ii) වැටුප් පරිමාණය 2012.03.19 දින සිටම JM 1-1 (i) වැටුප් පරිමාණය දක්වා ඉහළ දැමිය යුතු නමුත් දෙවන පාර්ශ්වය එය පැහැර හැර ඇති බවක් කියා සිටී. එසේ පැහැර නොහැරියේ නම් ඒ.ආර්. කරුණාසේන මහතාට MM 1-1 (ii) ශ්‍රේණියට අනුරූප ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරි තනතුර iv ශ්‍රේණියට උසස්වීමට හැකියාව තිබුනි.

නමුත් දෙවන පාර්ශ්වය විසින් පෙන්වා දෙන්නේ එම අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාවේම නිර්දේශ අංක: 13 මඟින් දක්වා ඇත්තේ මෙම 1 සිට 19 දක්වා සියලු නිර්දේශ 2021 ජනවාරි 01 දින වන විට සේවයෙන් විශ්‍රාම නොලබා සිටින සේවකයින් සඳහා පමණක් ක්‍රියාත්මක විය යුතු බවකි. අංක: 17 නිර්දේශය මගින් කියා සිටින්නේ යෝජිත සංශෝධන ක්‍රියාත්මක කිරීමෙන් පසු 2021 ජනවාරි 01 දිනට පවතින වැටුප් තලය එදින (2021.01.01) සිට ගෙවිය යුතු බවකි.

අංක 13, 17 නිර්දේශ අනුව මෙම අංක 2 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ඒ.ආර්. කාරුණාසේන මහතාට අදාළ නොවන බව දෙවන පාර්ශ්වයේ සාක්ෂි මගින් අවධාරණය කර සිටී. දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද විරෝධතාවය පිළිගනිමි. ඒ අනව අංක 10161 දරන අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාව මගින් ඒ.ආර්. කරුණාසේන මහතාට සහනයක් නොලැබෙනු ඇත.

සාක්ෂි විභාගයේදී පළමු පාර්ශ්වය විසින් මතු කරනු ලැබූ ඊලඟ තර්කය වනුයේ ඒ.ආර්. කරුණාසේන මහතා 2004 ජූලි මාසයේ සිට වරින් වර ඔහු දරමින් සිටි තනතුරට වඩා ඉහළ තනතුරුවලට වැඩ බැලීම සඳහා පත් කර සිට ඇති බැවින් ඔහුට එම ඉහළ තනතුරුවලට විශේෂයෙන් iv ශ්‍රේණිය ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරි (නව වැටුප් පරිමාණය MM1-1 (ii) තනතුරට උසස්වීමක් ලැබීමට අයිතියක් ඇති බවයි. ඒ.ආර්. කරුණාසේන මහතා වැඩ බැලීමේ තනතුරුවලට පත් කර ඇති ආකාරය පහත සටහනින් දක්වා ඇත.)

වැඩ බලන තනතුර සඳහා පත් කිරීම

| පැමිණිලිකරුගේ නිත්‍ය තනතුර | වැඩ බැලීමට පත් කළ තනතුර | සේවා ස්ථානය | වැඩ බැලීම් කළ කාල සීමාව | වැඩ බැලීම් කළ කාලය |
|---|---|---|---|---|
| ගිණුම් සහකාර vii “ආ ” ශ්‍රේණිය | වැ.බ. සහකාර ගණකාධිකාරි vi ශ්‍රේණිය | මොනරාගල | 2004 ජූලි සිට 2005 ජූලි | අවු:1 |
| ගිණුම් සහකාර vii “ආ ” ශ්‍රේණිය | වැ.බ. ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරි iv ශ්‍රේණිය | මොනරාගල | 2006 නොවැම්බර් සිට 2011 ජනවාරි | අවු:5 |
| සහකාර ගණකාධිකාරි vi ශ්‍රේණිය | වැ.බ. ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරි iv ශ්‍රේණිය | මොනරාගල | 2011 ජනවාරි සිට 2012 පෙබරවාරි | අවු:1 |
| සහකාර ගණකාධිකාරි vi ශ්‍රේණිය | වැ.බ. ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරි iv ශ්‍රේණිය | මාතර | 2012 පෙබරවාරි සිට 2012 ජූලි | මාස:05 |
| සහකාර ගණකාධිකාරි vi ශ්‍රේණිය | වැ.බ. ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරි (iv) සහ කළමනාකරු (මුදල්) iii | කොළඹ දිස්ත්‍රික් කාර්යාලය | 2012 ජූලි සිට 2014 ජූනි | අවු:2 |
| සහකාර ගණකාධිකාරි vi ශ්‍රේණිය | වැ.බ. ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරි iv ශ්‍රේණිය | කොළඹ උතුර | 2014 ජූනි සිට 2014 සැප්තැම්බර් | මාස:02 |
| සහකාර ගණකාධිකාරි vi ශ්‍රේණිය | වැ.බ. ගණකාධිකාරි iv ශ්‍රේණිය | කොළඹ දකුණ | 2014 සැප්තැම්බර් සිට 2015 ජූලි | මාස:11 |
| සහකාර ගණකාධිකාරි vi ශ්‍රේණිය | වැ.බ. ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරි iv ශ්‍රේණිය | කොළඹ උතුර | 2011 ජූලි සිට 2018 ජූනි | අවු:3 |

නමුත් ආයතනයේ පවතින අනුමත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය අනුව වැඩ බැලීමේ පදනම මත උසස්වීමක් ලබා දීමට කිසිදු ඉඩක් නොමැති බව සාක්ෂි විභාගයේදී දෙවන පාර්ශ්වය විසින් දිගින් දිගටම පෙන්වා දී ඇත.

දෙවන පාර්ශ්වයේ සහකාර සාමාන්‍යාධිකාරියගේ මූලික සාක්ෂි ලබා දීමේදී කරනු ලැබූ ප්‍රශ්න කිරීම් වලදී පහත පිළිතුරු ලබා දී ඇත. නමුත් එම පිළිතුරු බිඳ හෙලීමට පළමු පාර්ශ්වය අසමත් වී ඇත.

ප්‍ර: කරුණාසේන මහතාට විවිධ අවස්ථාවල තමන් ඉන්න තනතුරුවලට වඩා ඉහළ තනතුරුවල වැඩ බැලීමේ තනතුරුවලට පත් කරලා තියෙනවා. එම පත් කිරීම ඔහුට උසස්වීමක් ලබා දෙන කොට එම පත්වීම බලපානවාද?

පි: කාර්ය පටිපාටියේ තියෙනවා උසස්වීමක් ලබාදීමට හිමිකමක් නොවේ. උසස්වීම්වලදී සම්මුඛ පරීක්ෂණ කුසලතා වලදී ආයතනයට සේවකයා දක්වලා තියෙන සේවය අනුව ලකුණු ප්‍රමාණයක් ලබා දෙනවා.

(2024.05.20 දින සාක්ෂි සටහන් පිටු අංක: 08)

සාමානකාධිකාරීවරිය තවදුරටත් ප්‍රශ්න කිරීමවලට පිළිතුරු ලබා දෙමින් තවදුරටත් එම කරුණු තහවුරු කර සිටී.

ප්‍ර: ඉල්ලුම්කරුගේ ඉල්ලීම අනුව වැඩ බලන තනතුරක රාජකාරි කරමින් සිටින විට ඉහළ තනතුරකට පත්වීමට ඉල්ලීමක් කළ විට ඒ ඉල්ලීම ලබාදීමට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුව ඉඩ කඩ තියෙනවාද?

පි: සේවකයෙක් ඉල්ලූ පරිදි එසේ කරන්නේ නැහැ. ආයතනයේ අවශ්‍යතාවය හා පුරප්පාඩු අනුව අයදුම්පත් කැඳවන්නේ. කළමනාකරණයයි ඉදිරි තීරණ ගනු ලබන්නේ.

(2024.05.20 දින සාක්ෂි සටහන් පිටු අංක: 10)

එබැවින් ඒ.ආර්. කරුණාසේන මහතාම වැඩ බැලීමේ පදනම් මත උසස්වීම් ලබාදීමට දෙවන පාර්ශ්වයට නිත්‍යානුකූල හැකියාවක් නොමැති බව පිළිගනිමි.

පළමු පාර්ශ්වය විසින් තවත් තර්කයක් මතු කරමින් සාක්ෂි විභාගයේදී දිගින් දිගටම පෙන්වා දීමට උත්සහ කරන ලද්දේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අභිමතය පරිදි සමහර සේවකයින්ට උසස්වීම් ලබා දී ඇති බවත් තමන්ට වඩා පහළ ශ්‍රේණිවල සිටි සේවකයින් ද තමන්ට වඩා ඉහළ තනතුරු වලට පත්වීම් ලබා දී ඇති බවත්ය.

අධ්‍යක්ෂක මණ්ඩලය විසින් එසේ විධිමත් නොවන ආකාරයෙන් කටයුතු කර ඇත්නම් ඒ. ආර්. කරුණාසේන මහතාට එවැනි අවස්ථාවක ඊට එරෙහිව නීතිමය පියවර ගැනීමට ඉඩ තිබු නමුත් ඔහු එසේ කර නැත. අවුරුදු ගණනාවක් බලා සිට විශ්‍රාම ගැනීමෙන් පසුවද අවුරුද්දක පමණ කාලයක් බලා සිට එම තර්කය මෙම බේරුම්කරණයේදී ඉදිරිපත් කිරීමෙන් පලක් නැත. මෙහිදී මා ඉදිරියේ සලකා බැලිය හැකි කරුණ වනුයේ විධිමත් ක්‍රමය අනුව ඒ. ආර්. කරුණාසේන මහතාට MM 1-1 වැටුප් පරිමාණයට අදාළ ශ්‍රේණියට උසස්වීමේ අයිතියක් තිබුනේද යන්න පමණකි. ඒ.ආර්. කරුණාසේන මහතාගේ වාසියටද එම අවිධිමත් ආකාරයට උසස්වීමක් ලබා දීමට යෝජනා කිරීමට හැකියාවක් නැත.

**නිගමනය:**

01. ඒ.ආර්. කරුණාසේන මහතාට ඔහු විශ්‍රාම ලබා ගන්නා අවස්ථාව වන විට ලැබී තිබූ JM 1-1 (ii) වැටුප් පරිමාණයට අදාළ ශ්‍රේණියේ ගිණුම් නිලධාරි (vi ශ්‍රේණියේ ගණකාධිකාරි) තනතුර විධිමත්ව ලැබී ඇති අතර ඔහුට අසාධාරණයක් සිදුව නැත.

02. JM 1-1 (ii) වැටුප් පරිමාණයට අදාළ ශ්‍රේණියේ ගිණුම් නිලධාරි (v ශ්‍රේණියේ ගණකාධිකාරි) තනතුර සඳහා අයදුම් කර නැත.

03. MM 1-1 (ii) වැටුප් පරිමාණයට අදාළ iv ශ්‍රේණියේ ගණකාධිකාරි තනතුරට අයදුම් කිරීම සඳහාවත් ඒ.ආර්. කරුණාසේන මහතා සුදුසුකම් සපුරා නැත.

04. අවුරුදු 4කට වරක් උසස්වීම් ලබා දෙන ක්‍රමයක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය තුළ ක්‍රියාත්මකව තිබී නැත.

05. 2021 ජනාවාරි 11 දිනැති අංක 10161 දරන අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාවෙන් සේවකයින්ට ලබා දී ඇති සහන ඒ.ආර්. කරුණාසේන මහතාට අදාළ වී නැත.

06. ඉහළ තනතුරුවල වැඩ බැලීමේ රාජකාරි සඳහා යොදවා තිබීම මත ඒ.ආර්. කරුණාසේන මහතාට එම ඉහළ තනතුරුවලට පත් කිරීම සඳහා ඉල්ලා සිටීමට එම කරුණ පමණක් පදනම් කර ගැනීමට අයිතියක් නැත.

**ප්‍රදානය**

ඒ.ආර්. කරුණාසේන මහතාට ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ MM 1-1 (ii) වැටුප් පරිමාණයට අදාළ ගණකාධිකාරි තනතුරක් ලැබීමට සුදුසුකම් නැත. මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයකි.

**එම්. එම්. අයි. ඒ. ජයතිලක**
බේරුම්කරු.

2025 සැප්තැම්බර් 04 වන දින.

EOG 10 - 0253

මගේ අංකය: IR/COM/05/2018/190.

**කාර්මික ආරාවුල් පනත – 131 වන අධිකාරය**

අංක 2447/24 දරන හා 2025.07.29 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශ්වයක් වශයෙන් වේයන්ගොඩ උතුවම් බෝගහවත්ත, සුසිරිපාය, අංක 71 හි පිහිටි පී.ඒ. බෝගොඩ මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ, 13, බ්ලූමැන්ඩල් පාර, අංක 223 හි පිහිටි උපාලි නිව්ස්පේපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A 11/2024 දරන හා 2025.03.10 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් උපාලි නිව්ස්පේපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A 11/2024 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියත්මක වීම 2026.07.28 දින සිට අවසන් වන බවට පනතේ 20(2) (ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ඔක්තෝබර් මස 16 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

පළමුවන උපලේඛනය

**'අ' ආකෘති පත්‍රය**

(3 වන නියෝගය)

**1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත**

**බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම**

ලිපිනය: උපාලි නිවුස්පේපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
223 බ්ලූමැන්ඩල් පාර,
කොළඹ 13.

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටය.

2025.07.29 දිනැති අංක 2447/24 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දාවූ ද, පී.ඒ. බෝගොඩ සහ උපාලි පුවත්පත් (පුද්) සමාගම බැඳී සිටින්නාවූ ද 2025.03.10 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අත්සන -

පිටපත: (අනෙක් පාර්ශ්වය)

පී.ඒ. බෝගොඩ,
නො. 71, සුසිරිපාය, උතුවම්,
බෝගහවත්ත, වේයන්ගොඩ.

(1) ප්‍රතික්ෂේප කරන පාර්ශ්වය, වෘත්තීය සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා විසින් අවස්ථාවෝචිත පරිදි තීරණයෙන් බැඳී සිටින අනෙකුත් සෑම පාර්ශ්වයකටම, වෘත්තීය සමිතියකට, සේවායෝජකයෙකුට සහ සේවකයෙකුටම වෙන වෙනම දැන්වීම් යැවිය යුතුය. (පනතේ 9(1), 15(1) හා 20(1) වන වගන්තිය බලන්න.)

(2) දැන්වීම අත්සන් කරන තැනැත්තා එය අත්සන් කරන්නේ වෙනත් යම් පාර්ශ්වයක්, සේවා යෝජකයෙකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් නම් ඒ තැනැත්තා එය අත්සන් කරන්නේ කවර පාර්ශ්වයක්, සේවායෝජකයෙකු වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් ද යන වග ද වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් වන විට ඔහු ඒ වෘත්තීය සමිතියේ දරන තනතුර ද නිශ්චිතව සඳහන් කළ යුතුය.

EOG 10 - 0254

---

මගේ අංකයඃ IR/COM/04/2023/76.

**කාර්මික ආරාවුල් පනත – 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2024.12.20 දිනැති හා අංක 2415/64 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2024.12.09 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් ගම්පහ, පාරක්‍රම පාර, අංක 03 ලිපිනයෙහි පදිංචි ටී.එම්.ඩී.ඩී.කුමාරි මඩාටුව මිය සහ කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, තැ.පෙ. 2085 ලිපිනයෙහි පිහිටි HDFC බැංකුව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/76/2024 හා 2025.08.21 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ඔක්තෝබර් මස 16 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව කොළඹ 05

**බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවවේදීය**

නඩු අංකය - A/76/2024
මගේ අංකය - IR/COM/04/2023/76

T.M.D.D. කුමාරි මඩාටුව මිය,
අංක 03,
පරාක්‍රම පාර,
ගම්පහ.

*පළමු පාර්ශ්වය*

HDFC බැංකුව
තැ.පෙ. 2085,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.

*දෙවන පාර්ශ්වය*

## බේරුම්කරණ තීන්දු ප්‍රකාශය

කම්කරු අමාත්‍ය මහාචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ආචාර්ය කේ.ඒ. තිලකරත්න වන මා පත්කර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවතින කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ -

“HDFC බැංකුවේ ජාඇල ශාඛාවේ කළමනාකාරිණිය ලෙස සේවය කරන ටී.එම්.ඩී.ඩී. කුමාරි මඩාටුව මහත්මියට එම බැංකුවේ සිදු වී ඇති ව්‍යාජ රන් භාණ්ඩ උකස් ගැනීමක් සම්බන්ධයෙන් පවත්වන ලද විනය පරීක්ෂණයෙන් අනතුරුව ඇයට ලබා දී ඇති විනය දඬුවම මගින් අසාධාරණයක් සිදුවී තිබේද යන්නත්, එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඇයට හිමිවිය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ.”

ඉහත කාර්මික ආරාවුල මෙම බේරුම්කරණ අධිකරණය විසින් 2025.01.24, 2025.03.11, 2025.04.08, 2025.05.23, 2025.06.17 හා 2025.07.14 යන දින වල දී විභාගයට ගන්නා ලදී.

ටී.එම්.ඩී.ඩී. කුමාරි මඩාටුව මහත්මිය හා HDFC බැංකුව අතර ඇතිවී තිබෙන කාර්මික ආරාවුලෙහි සාරාංශගතය පහත සඳහන් පරිදි වේ.

කුමාරි මඩාටුව මහත්මිය ජාඇල බැංකු ශාඛාවේ කළමණාකාරිය වශයෙන් සේවය කරමින් සිටියදී එම බැංකු ශාඛාවේ රන්භාණ්ඩ උගස් ගැනීමේදී ව්‍යාජ රන්භාණ්ඩ උගස් ගැනීමක් පිළිබඳව ඇයට චෝදනා පහකින් යුත් චෝදනා පත්‍රයක් ලබා දී තිබේ. එම චෝදනා පත්‍රයට ලිඛිත පිළිතුරු ප්‍රකාශ ලබාදී ඇති අතර එම චෝදනා සම්බන්ධව විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා ඇත. චෝදනා පත්‍රයේ සඳහන් චෝදනා 5න් 1,2,3,5 යන චෝදනා වලට කුමාරි මඩාටුව මහත්මිය වැරදිකාරිය කොට ඇති අතර 4 වන චෝදනාවට නිවැරදිකරු බවට තීරණය කොට තිබේ. බැංකුවේ විනය කමිටුවේ නිර්දේශ අනුව පහත සඳහන් දඬුවම් ඇයට ලබාදී ඇත.

1. මෙවැනි සිදුවීම් මින් ඉදිරියට සිදු නොවීම වගබලා ගන්නා ලෙස අවවාද කරන බවත්, මෙම අවවාද කිරීම හේතුවෙන් 2020.05.26. සිට 2022.05.26 දක්වා වසර දෙකක කාල සීමාව තුළ උසස්වීම් ඉල්ලීම සඳහා හිමිකම් නොමැති බව.

2. අත්හිටවූ 2020 දෙසැම්බර් හා 2021 අප්‍රේල් මස ප්‍රසාද දීමනා නොගෙවන බව.

තම විනය නියෝගයට එරෙහිව කුමාරි මඩාටුව මහත්මිය විසින් අභියාචනයක් HDFC බැංකුව වෙත ඉදිරිපත් කළ ද ලබා දී ඇති දඬුවම වෙනස් නොවන බව එම බැංකුවේ අභියාචනා කමිටුව විසින් තීරණය කොට තිබේ.

HDFC බැංකුවේ වලංගු විනය පාලන රීති කණ්ඩය පදනම් කොට ඉහත සඳහන් විනය ක්‍රියාමාර්ග ගෙන ඇතත් පහත සඳහන් කරුණු කෙරේ බේරුම්කරණ අධිකරණයේ අවධානය නඩු විභාගය අතරතුර යොමු විය.

1. ජාඇල බැංකු ශාඛාවේ තිබූ රන් භාණ්ඩ බැංකුවේ මුලස්ථානයේ රන් ණය කළමනාකරු විසින් ලබාගෙන 2019.08.31 දින වව්නියාවේ ශාඛාවේ පැවැති වෙන්දේසියට ඉදිරිපත් කළ විට ඒවා ව්‍යාජ රන්භාණ්ඩ බවට හඳුනාගෙන ඇත. එම අනාවරණයෙන් එය බැංකුවේ විගණන නිලධාරීන් විසින් සිදු කරන ලද පරීක්ෂණයකින් පසුව පාලන අධිකාරිය මඩාටුව මිය වෙත චෝදනා පත්‍රයක් නිකුත් කොට තිබේ.

රන් භාණ්ඩ උකස් ගැනීමට අදාළව අනුගමනය කළ යුතු විධිවිධාන හා ක්‍රියාපටිපාටින් පිළිබඳව පැහැදිලි උපදෙස් මාලාවක් බැංකුව විසින් නිකුත් කර තිබුණද ඒවා නිසි පරිදි ක්‍රියාත්මක වීම පිළිබඳව නිසි කළමනාකරණයක් හෝ අධීක්ෂණයක් බැංකුව සතුව නොපැවති බවද සාක්ෂි විභාගය පුරාම විද්‍යාමාන වූ කරුණක් විය.

රන් භාණ්ඩ ව්‍යාජ රන් භාණ්ඩ වූයේ කෙසේද? ඒවා ව්‍යාජ රන් භාණ්ඩ බැංකුව නොමග යවා උකස් කොට ඇත්ද? උකස් කටයුතු භාර නිලධාරිනිය රන් භාණ්ඩ වෙනස් කොට ව්‍යාජ රන්භාණ්ඩ උකස් ගනු ලැබුවේද? බැංකු ශාඛාවේ රන්භාණ්ඩ වව්නියාවට ගෙනයාමේදී ඒවා ව්‍යාජ රන්භාණ්ඩ වලට මාරු කළේද යනාදී ගැටලු රාශියක් අධිකරණ ක්‍රියාවලිය තුළ ප්‍රශ්න ගතව පැවතුනි.

වෙන්දේසි අවස්ථාවේදී රන්භාණ්ඩ ව්‍යාජ රන් බවට හඳුනා ගන්නා තෙක් සුපරීක්ෂණයක් සිදු නොවීමද, බේරුම්කරණ අධිකරණය ගැටලුවක් වශයෙන් හඳුනා ගන්නා ලදී. විශේෂයෙන්ම බැංකුවේ විගණන අංශය මෙම කටයුත්තට මැදිහත් වී ඇත්තේ රන් භාණ්ඩ ව්‍යාජ රන්භාණ්ඩ බවට හඳුනා ගැනීමෙන් පසුව බව නිරීක්ෂණය විය. ආයතනයක විගණන අංශයේ වගකීම විය යුත්තේ අඛණ්ඩ විගණන ක්‍රියාවලියක් පවත්වා ගැනීමයි. ඒ ජාඇල බැංකු ශාඛාවේ උකස්ගත් රන් භාණ්ඩ පිළිබඳව විගණනයක් විගණන අංශය හෝ රන් භාණ්ඩ කළමනාකරු විසින් සිදු කළ අවස්ථාවක් පිළිබඳ තොරතුරු බේරුම්කරණ අධිකරණය වෙත ඉදිරිපත් වීමක් සිදු නොවීය.

2. විධිමත් චෝදනා පත්‍රයෙහි චෝදනා 05ක් ඇතුළත් වේ. එම චෝදනා ලඝු කොට ගත්විට, ශාඛා කළමනාකරු වෙත චෝදනා කොට ඇත්තේ ව්‍යාජ රන් භාණ්ඩ උකස් කිරීම සම්බන්ධයෙන්ම නොවේ.

පළමු චෝදනාවේ දැක්වෙන පරිදි "එසේම ජාඇල ශාඛාවේ තිබූ අනු අංක 6-8 දක්වා වූ රන් භාණ්ඩද පසුව පරීක්ෂා කිරීමෙන් අනතුරුව ව්‍යාජ රන් භාණ්ඩ බවට හඳුනාගත් නමුත් ඒ බව ඔබ විසින් කළමනාකරු මෙහෙයුම් වෙත දැනුවත් නොකිරීම" ලෙස දක්වා ඇත.

ඉහත චෝදනාවට පිළිතුරු ගරු බේරුම්කරණ අධිකරණය විසින් ගොනු කිරීමේදී පළමු පාර්ශ්වය දක්වා ඇත්තේ විගණන අංශය හා රන් කළමනාකරු විසින් මෙම තත්ත්වය හඳුනාගෙන තිබියදී යළි යළිත් ඒ පිළිබඳව දැනුවත් කිරීමට විශේෂ අවශ්‍යතාවයක් නොතිබූ බවයි.

එමෙන්ම අනෙකුත් චෝදනා වලින් දක්වා ඇත්තේද සේවකයන් විසින් කරන ලද වරදක් පිළිබඳව දැන සිටිමින් ඒ බව බලයලත් නිලධාරින්ට දැනුම් නොදීම.

බැංකුවට අලාභ වන පරිදි දැඩි ලෙස නොසැලකිලිමත් ලෙස කටයුතු කිරීම උකසට ගත් රන් භාණ්ඩ මාසිකව අදාළ රන් භාණ්ඩ ලේඛන ගත කළ රෙජිස්ටරය සමඟ සසඳා එම රන් භාණ්ඩවල රන් අගය හා බරෙහි නිරවද්‍යතාවය පිළිබඳව නිකුත් කළ අහඹුවෙන් පරීක්ෂා නොකිරීම මෙන්ම ඉහත චෝදනාවල ඇතුළත් වැරදි සහ විෂමාචාරයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම සිදුකිරීම මගින් විශ්වාසය බරපතල ලෙස කඩකිරීම යනාදීය වේ.

චෝදනා පත්‍ර තුළින් උල්ලංඝනය කිරීම් පහත සඳහන් පරිදි දක්වා තිබේ.

i. අංක GCL/2017/226 දරන 2017.06.29 දිනැති කාර්යාලීය චක්‍රලේඛය උල්ලංඝනය කිරීම.

ii. බැංකුවේ විනය රීති කාණ්ඩයේ උපලේඛන අංක 3හි, සේවකයන් කරනු ලබන බරපතල වැරදි යටතේ 27 වන වගන්තිය උල්ලංඝනය කිරීම.

iii. බැංකුවේ සංශෝධන විනය රීති කාණ්ඩයේ උපලේඛන 03 යටතේ 03 වන වගන්තිය උල්ලංඝනය කිරීම.

IV GL/2012/082 (Ravision 12) දරන 2018.10.17 දිනැති චක්‍රලේඛය 15 වන වගන්තිය උල්ලංඝනය කිරීම.

මෙම චෝදනා සඳහා පිළිතුරු සැපයීමේදී ජාඇල ශාඛාවේ ප්‍රධාන කළමනාකාරිනී විසින් යොමු අංක HR/L/2020/7/26 දරන චෝදනා පත්‍රයට පිළිතුරු සැපයීම යන මැයෙන් 2020.07.23 දිනැතිව ප්‍රධාන කළමනාකාරිනී (පාලන හා මානව සම්පත්) වෙත යොමු කළ ලිපියෙන් එමෙන්ම දඬුවම් පැමිණවීමේ නියෝගයට අභියාචනයක් ඉදිරිපත් කිරීම යන මැයෙන් සහකාර සාමාන්‍යාධිකාරී මානව සම්පත් අංශය අමතන ලද 2021.08.09 දිනැති ලිපියෙන්ද එසේ චෝදනා සඳහා සවිස්තරාත්මකව කරුණු පැහැදිලි කොට ඇති බවද ගරු බේරුම්කරණ අධිකරණය විසින් නිරීක්ෂණය කරන ලදී.

විනය දඬුවම් පැනවීමේදී සහ දඬුවම් යටතේ අවවාද කිරීම් (අදාළ සිද්ධිය අනාවරණය වූ දින සිට වසර 02 ක කාලයක් සඳහා බලපැවැත් වේ. එම කාලසීමාව තුළ උසස්වීම් සහ /හෝ සේවා දිගුවක් ලබාදීම විනය කමිටුවේ නිර්දේශය මත සිදු කළ හැක.) මත පැමිණිලිකාරිය වෙත දඬුවම් නියම කොට ඇති බවද නිරීක්ෂණය විය.

HDFC බැංකුවේ සංශෝධන විනය පාලක රීති කාණ්ඩයේ සුළු දඬුවම් යටතේ මෙම බැංකු කළමනාකාරියට අවවාද කිරීම් සිදුකොට බරපතල දඬුවම් යටතේ ප්‍රසාද දීමනා නොගෙවීමට ද බැංකුව ක්‍රියා කොට ඇති බවද නිරීක්ෂණය වේ.

**තීන්දු ප්‍රකාශය**

පළමුවන පාර්ශ්වය වන T.M.D.D.කුමාරි මහත්මිය මෙම බේරුම්කරණ අධිකරණයෙන් පහත සඳහන් සහනයන් අපේක්ෂා කෙරේ.

ජාඇල බැංකු ශාඛාවේ සිදු වී ඇති ව්‍යාජ රන් භාණ්ඩ උකස් ගැනීමක් සම්බන්ධයෙන් පවත්වන ලද විනය පරීක්ෂණයෙන් අනතුරුව ඇයට ලබාදී ඇති විනය දඬුවම මගින් අසාධාරණයක් සිදුව ඇත්ද. එනම් බැංකුවේ විනය කමිටුව නිර්දේශ මත ලබාදී ඇති පහත සඳහන් දඬුවම් ඉවත් කර සහනයක් ලබා ගැනීම වේ.

1. පළමු පාර්ශ්වයට 2021 ජූලි 12 දිනැතිව ලබාදී ඇති විනය දඬුවම සාධාරණ හා යුක්ති සහගත නොවන බවට තීරණයක් ලබා ගැනීම.

2. එම විනය නියෝගය ඉවත්කර ගැනීම.

3. වසර දෙකක කාලයකට උසස්වීම් ඉල්ලීම් සඳහා හිමිකම් නොමැති බවට වූ විනය නියෝගය ඉවත්කර ගැනීම හා එම කාල සීමාවේදී පළමු පාර්ශ්වයට ලැබීමට තිබූ උසස්වීම් වලට අදාළ වැටුප් ලබා ගැනීම.

4. අත්හිටුවන ලද 2020 දෙසැම්බර් සහ 2021 අප්‍රේල් ප්‍රසාද දීමනා ලබා ගැනීම.

5. සුදුසු වෙනත් සහන ලබා ගැනීම වේ.

මෙම බේරුම්කරණ අධිකරණය විසින් පැමිණිලිකාරියගේ ඉල්ලීම් සම්බන්ධව පහත සඳහන් පරිදි කටයුතු කළ යුතු බවට නියෝග කරමි.

1. පැමිණිලිකාරිය හෙවත් T.M.D.D. කුමාරි මඩාටුව මිය වෙත අවවාද කිරීම හේතුවෙන් 2020.05.26 දින සිට 2022:05.26 දක්වා වසර දෙකක කාලසීමාව තුළ පනවා තිබූ උසස් වීම් ඉල්ලීම සඳහා හිමිකම් නොමැති බවට වූ විනය නියෝගය සාධාරණ හා යුක්ති සහගත නොවන බවට තීරණය කරමි.

ඒ අනුව 2020.05.26 සිට 2022.05.26 යන වසර දෙක කාල සීමාව තුළ උසස්වීම් සඳහා ඉල්ලීම සැලකිල්ලට ගෙන නියමිත දිනට අදාළ උසස්වීම ලබාදීමට සහ ඊට අදාළ හිග ගෙවීම් ලෙස ගොනුවේ ඒ 10 ලේඛනයේ සඳහන් පරිදි රු.371469.12 මුදල (රුපියල් තුන් ලක්ෂ හැත්තෑ එක් දහස් හාරසීය හැට නවයයි ශත දොළහක්) මෙම නියෝගය රජයේ ගැසට් පත්‍රයේ පළවී මාස 3ක් ඇතුළත ගෙවීම් සිදු කොට ඒ බව දකුණු කොළඹ සහකාර කම්කරු කොමසාරිස් වෙත වාර්තා කලයුතු බවට නියම කරමි.

2. ව්‍යාජ රන් භාණ්ඩ උකස් ගැනීමක් තම පරිපාලනය යටතේ තිබූ බැංකු ශාඛාව තුළ සිදුවීම පිළිබඳව කිසියම් වගකීමක් එහි කළමනාකාරිත්වයට පැවරේ. එබැවින් පැමිණිලිකාරියට ගෙවීම් අත්හිටුවා ඇති 2020 දෙසැම්බර් සහ 2021 අප්‍රේල් මස ප්‍රසාද දීමනා සඳහා ඇයට හිමිකම් නොමැති බවටද තීරණය කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බවද වැඩිදුරටත් සඳහන් කරමි.

ආචාර්ය **කේ.ඒ. තිලකරත්න**,
බේරුම්කරු.

2025 අගෝස්තු 21 වැනි දින,
කාර්මික අධිකරණ ශාඛාවේදීය.

EOG 10 - 0255

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.